GMOA
TU No. 291
ESTABLISHED IN 1926
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No. 275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 2503586 / 4518668
Web : www.gmoa.lk
Email : gmoasrilanka@sltnet.lk

26-08-2011

පුවත්පත් නිවේදනය

රාජ්‍ය සේවා කොමිෂන් සභාව සියළුම රජයේ සේවකයන්ගේ පත්වීම්,මාරුවීම් සහ විනය සම්බන්ධ කටයුතු කරන එකම ස්වාධීන ආයතනයවේ.

එම ආයතනයේ තීරණවලට අභියෝග කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා පිළිගත් නීති ක්‍රමවේදයන් අනුගමනය කළ යුතුයි. එම ක්‍රමවේදයන්ගෙන් පරිබාහිරව රාජ්‍යසේවා කොමිසන් සභාවේ ස්වාධීනත්වයට හා ගෞරවයට හානිවන පරිදි අභියෝග හෝ බලපෑම් එල්ල කිරීම සමස්ථ රාජ්‍ය සේවය හැල්ලුවට ලක්කිරීමකි. එබැවින්, රාජ්‍යසේවා කොමිෂන් සභාවේ ස්වාධීනත්වය හා ගරුත්වය රැකීම උදෙසා අපගේ උපරිම සහයෝගය පළකිරීමට කැමැත්තෙමු.

කොළඹ ජාතික රෝහලේ අධ්‍යක්ෂක තනතුරෙහි ඇතිවූ පුරප්පාඩුව පිරවීම සඳහා අයදුම්පත් කැඳවීමෙන් පසුව දැඩි ව්‍යාකූල තත්වයක් ඇතිවිණ. ඒ හේතුවෙන් රෝගී සේවාවට ඉතා වැදගත්වන මෙම තනතුරෙහි වූ පුරප්පාඩුව නිසිපරිදි පිරවීම ප්‍රමාදවිය.

කෙසේ නමුත් රාජ්‍යසේවා කොමිෂන් සභාව මෙම තත්වය තේරුම්ගෙන, ඉතාම කාර්යක්ෂමව සහ අපක්ෂපාතීව කටයුතු කිරීම නිසා මේ වනවිට මෙම පුරප්පාඩුව නිසිපරිදි පිරවීමට අවකාශ සැලසී ඇත.

මේ සම්බන්ධව රජයේ වෛද්‍ය නිලධාරී සංගමයේ ප්‍රසාදය රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පළකරණ අතර කොමිෂන් සභාවේ නියෝගය කඩිනමින් ක්‍රියාවේ යෙදවීමට සෞඛ්‍ය ලේකම්වරයා ක්‍රියාකළයුතු බවද අවධාරණය කරමු.

කෙසේ වෙතත් කොළඹ ජාතික රෝහලේ අධ්‍යක්ෂකධුරය පිළිබඳ සම්මුඛපරීක්ෂණය මෙතෙක් නොපැවැත්වීම පිළිබඳව අපගේ දැඩි අප්‍රසාදය සෞඛ්‍ය අමාත්‍යංශයවෙත පලකරන අතර, මේ සම්බන්ධයෙන් 28-08-2011 දින පැවැත්වෙන මධ්‍යම කාරක සභාවේදී විශේෂ අවධානය යොමු කිරීමට නියමිතය.

එමෙන්ම සෞඛ්‍ය අමාත්‍යංශයේ පුරප්පාඩු වී ඇති සියළුම වෛද්‍යපරිපාලක තනතුරු පිරවීමට ඉක්මනින් කටයුතු කළයුතුව ඇත. එලෙසම, සෞඛ්‍ය අමාත්‍යංශය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පැහැර හරිමින් දැනටමත් සිදුකර ඇති සියලු ස්ථාන මාරුවීම් අවලංගු කිරීමට කටයුතු කළයුතුව ඇති බව අප දන්වා සිටිමු.

ස්තූතියි

වෛද්‍ය චන්දික එපිටකඩුව
ලේකම්.

විමසීම් වෛද්‍ය සංකල්ප මාරසිංහ- 0714486770
වෛද්‍ය උපුල් ගුණසේකර - 0716841272

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය